- **විස්මය නැමති ස්ථායි භාවය නිරූපණය**

අප ජීවත් වන නිවසෙහි පවුලේ සාමාජිකයන්ගේ හා අවට පරිසරය තුළ ජීවත් වන විවිධ පුද්ගලයන්ගේ හැසිරීම් රටා හොඳින් නිරීක්ෂණය කිරීම මගින් විවිධ අත්දැකීම් ලබා ගත හැකි ය. මෙහි දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු විය යුතු යි. ගමන් විලාස, හැසිරීම් රටා, ශරීර ස්වභාවය, කතා විලාස යන මේවා නිරීක්ෂණය කිරීමේ දී එකිනෙකා අතර විවිධ වෙනස්කම් දක්නට ලැබේ. සෑම පුද්ගලයකුට ම තමන්ට ම ආවේණික හැසිරීම් රටා ඇති බව මින් අනාවරණය වේ.

විවිධ වූ හැසිරීම් රටා ඇති චරිත නිරීක්ෂණය කරමින් එම චරිත අනුකරණ අවස්ථා නිර්මාණයේ දී භාව ප්‍රකාශන දැක්වීමට එහි රස හා භාව හඳුනා ගත යුතු යි.

රස හා භාව යනු, එකිනෙකට සම්බන්ධතා ඇති ව පවතින්නකි. රසය නොමැති ව භාවයත්, භාවයෙන් තොර ව රසයත් නූපදී. භරත මුනිවරයා නාට්‍ය ශාස්ත්‍රයේ රස අටක් හඳුන්වා දෙන අතර, මෙකී රස අට ඉපදවීමට හේතු වූ ස්ථායි භාව අටක් ද දක්වා තිබේ. ඒ අනුව භාවය පෙරටු කොට ගෙන රසය උපදී. මින් එක් රසයක් වන අද්භූත රසය පිළිබඳ ව විමසා බලමු.

විස්මය නම් වූ ස්ථායි භාවය මුල්කොට ගනිමින් අද්භූත රසය උපදියි. නුහුරු නුපුරුදු අත්දැකීම්වලට මුහුණ දීම, ඇදහිය නොහැකි වූ සිද්ධීන්ට මුහුණ දීම ආදි වූ විභාවයන්ගෙන් අද්භූත රසය උපදින බව උදාහරණ ලෙස දැක්විය හැකි ය.

ඇස් පළල් කිරීම, ඇසිපිය නොහෙළා බලා සිටීම, කඳුළු සැලීම, ප්‍රීතිය ප්‍රකාශ කිරීම, ගල් ගැසුණාක් මෙන් නිශ්චල ව සිටීම, ගොත ගැසීම, ආදි අනුභාව මගින් මෙම භාවය නිරූපණය වේ.



(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

පහත දී ඇති සිද්ධිය නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරන්න.

1. සෙනුර හා දෙව්මිණි ආදරයෙන් රැක බලාගත් මව හදිසියේ රෝගාතුර වී ටික දිනකින් මිය ගියා ය. දුක සේ ජීවත් වූ මොවුන් දෙදෙනාට අන් සරණක් නොවී ය. තම පියා නිතර ම ඔවුන්ට තරවටු කරන්නට විය. දවසක් දෙව්මිණි මකුළු දැල් කඩන විට බිත්තියේ එල්ලා තිබූ මවගේ පින්තූරය බිමට වැටී බිඳිණි. ඇය ඉකි ගසමින් හඬන්නට වූවා ය. මේ දුටු සෙනුර මව මිහිදන් කළ ස්ථානයට යෑමට දෙව්මිණිට යෝජනා කළේ ය. ඒ සඳහා ටික දුරක් ගෙවා ගෙන යා යුතු ය. දෙදෙනා මව මිහිදන් කළ ස්ථානයට යෑමට පිටත් වූහ. ඒ යන අතර මග දී තද වැස්සකට අසු වූහ. තෙත බරිත වූ මොවුහු අසල තිබූ දේවස්ථානයට ගොඩ වැදී මුල්ලකට වී වකුටු වූහ. දෑස් මඳින් මඳ පියවී ගිය දෙව්මිණිට සුදෝ සුදු ඇඳුමින් සැරසුණු තම මව තමන් දෙසට පියා නගන බව දැක, ''අම්මා අම්මා''යැයි කියමින් විස්මයෙන් කෑ ගසන්නට වූවා ය.

2. එක් ගමක ගමරාල, ගම හාමිනේ හා ගම දුවක් සතුටින් ජීවත් වෙති. ගම දුව හරි ම හුරුබුහුටි ය. ගම දුව මිදුලේ සෙල්ලම් කරමින් විනෝදයෙන් කාලය ගත කරයි. දිනක් හදිසියේ ඇය අසනීප වූවා ය. සමහර වේලාවට හිස දෙපසට වනමින්, නටන්නට හා කෑගසන්නට ද වූවා ය. ගමේ හැමෝම ඇයට 'යකෙක් වැහිලා' යි කීහ. ගමරාලත්, ගම හාමිනේත් කොතරම් වෙදකම් කළත් ඉන් පලක් නොවී ය. ඉන් පසු ඔවුහු දෙදෙනා 'අපි තොවිලයක් කරමු' යි කතිකා කර ගත්හ.

- විස්මය නැමති ස්ථායි භාවයෙන් උපදින රසය නම් කරන්න.
- විස්මය නැමති ස්ථායි භාවය ප්‍රදර්ශනය කරන්න.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)